# ලියෝ සහ රියෝ



නෙත්මි තිමන්සා විජේතුංග

# ලියෝ සහ රියෝ



නෙත්මි තිමන්සා විජේතුංග

# ලියෝ සහ රියෝ

නෙත්මි තිමන්සා විජේතුංග

ප්‍රථම මුද්‍රණය 2023

ISBN 978-624-206-678-3

කතෘගේ වෙනත් කෘති

| | |
|---|---|
| කාගෙද මේ වැඩ? | 2020 |
| දඟයා | 2021 |

ප්‍රකාශනය

නෙත්මි තිමන්සා විජේතුංග

මහ/ මහාමායා බාලිකා විදුහල

10 ශ්‍රේණිය

# පිදුම

මේ පොත ලිවීම සඳහා අපව යොමු කළ ආදරණීය ගුරු

මැණිවරුන් ,පියවරුන්

ඇතුලු විදුහල්පතිනියටද

නිරන්තරයෙන් මා දිරිගැන්වූ

අම්මා ,තාත්තා සහ මල්ලීටද

පසෙකින් සිට උපකාර කළ

අත්තම්මාටද ලොකු අම්මා ඇතුලු පවුලේ

සැමටද මෙම පොත

ආදරයෙන් පුද කර සිටිමි.

## පෙර වදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත් වෙන පවුලක් මෙන්ම ප්‍රඥා සම්පන්න දැනුමෙන් යුත් බහුවිද කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේ අපේක්ෂාවයි එසේ නම් පාසලට වගකීම්පවරන දරුවාගේ විභවතා හඳුනා ගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැලපෙන ලෙස හැඩ ගැස්වීම අපගේ වගකීමයි' එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි
එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී' දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.
මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර
2023 . 11 . 01

" අනේ අම්මි ඉක්මනට එන්න.... ඉක්මන්ට එන්න අම්මි."

සිහිතිගේ සද්දෙ ඇහිලා අම්ම ඉක්මනට දුවගෙන මිදුලට ආවා. සිහිති කියන්නෙ නයනගෙයි සුදත්ගෙයි එකම චූටි දුව. සිහිතිට තාම අවුරුදු පහයි. මේ චූටි සිහිති හැම තිස්සෙම කරන්නෙම දඟ වැඩ. ඉතින් මේවෙලාවෙ සිහිතිගෙ අම්මා දුවගෙන ආවෙ ගොඩක් බය වෙලා. මිදුලට ආපු අම්මට දකින්න ලැබුනේ සිහිති මිදුලේ මොකක් හරි වැටිල තියෙන දෙයක් ළඟ ඉඳගෙන බලන් ඉන්නවා. අම්ම හෙමින් හෙමින් ලන් වුනේ මොනා දිහාද මේ චූටි කෙල්ල බලන් ඉන්නෙ කියල බලන්න. අම්මගෙ හෙවනැල්ල දැකල සිහිති ඉක්මන්ට නැගිට්ටා. ඊට පස්සෙ ඒ චූටි අතින් බිම තිබුන මොකක්දෝ දෙයක් අර ගත්තා.

"දෙයියනේ " අම්මට ඉබේටම කියවුනා.

ඒ තිබුනෙ චූටි ලේන් කූඩුවක්. කූඩුවක් විතරක් නෙවෙයි ඒකෙ පොඩි පැටව් දෙන්නෙකුත් හිටියා.

" අම්මි අපේ නෝටි පුලුන් බබයි එහා ගෙදර ටොමියයි එකතුවෙලා අර ලේනව ඇල්ලුවා. මන් හිතන්නෙ ඒ මෙයාලගෙ අම්මා වෙන්න ඕනෙ."



මිදුලෙ අඹ ගහ අයිනෙ වැටිල හිටපු ලේනෙක්ට අත දික් කරලා ගෙදර බලු පැටියගෙ හපන් කම් ගැන සිහිති හරිම දුකින් කියුවා. අම්මා චූටි සිහිතිගෙ නලලින් හාදුවකුත් තියලා ලේන් කූඩුවත් අරන් සිහිතිවත් අරන් ගේ ඇතුලට ගියා. සාලයෙන් කූඩුව තියලා අම්මා සිහිතිට කියුව කූඩයක් වගේ මොකක් හරි දෙයක්  ගේන්න කියලා. කියන පමාවට සිහිති රුං ගාල දුවල ගිහින් මේකට හරියටම හරියන විදිහෙ චූටි කාලෙ එයාගෙ බඩු දාල තිබුන කූඩයක් අරගෙන ආවා. තාම ඇස්වත් ඇරල නැති චූටි ලේන් පැටවුන්ව කූඩුව පිටින්ම කූඩයෙන් තියලා අම්මා සිහිතිත් එක්කම මිදුලට ගිහින් පැටවු දෙන්නට සීතල නැතුව සනීපෙන් ඉන්න කූඩය හදන්න ඕනෙ බඩු හොයන්න පටන් ගත්තා.

චූටි පැටික්කි අම්මාගෙ ඇඟිල්ලෙ එල්ලිලා එක එක බොරු හුරතල් කතා කියව කියව හිනා වෙවී අම්මත් එක්ක ලේන් පැටවුන්ට ඕනෙ කරන බඩුහොයන්න උදවු වුනා.අන්තිමට ඉතින් ඔක්කොම බඩුත් හොයාගෙන එයාල ආපහු ගෙදර ආවා. අම්මයි සිහිති එකතු වෙලා අර කූඩෙ අරගෙන ඒකෙ රෙදි කෑලි පුලුන් වගේ දේවල් දාලා පැටවු දෙන්නට සැපට සීතල නැතුව ඉන්න පුලුවන් වෙන විදිහට ලස්සනට හදලා ලේන් පැටවු දෙන්නව පරිස්සමෙන් තිබ්බා.

"බලන්න අම්මි එයාල කොච්චර සනීපෙට නිදිද. තාත්ති ආවම මේක පෙන්නනකන් මට ඉවසිල්ලක් නෑ."

අත්පුඩි ගහ ගහ උඩ පනිමින් සතුටුවෙන සිහිතිව දැකල අම්මටත් හරිම සතුටු හිතුනා. සිහිති ඉක්මනට ඉස්කෝලෙ වැඩ ටික ඉවර කරල මඟ බලාගන හිටියෙ  සිහිතිගෙ තාත්තා ගෙදර එනකන්. සිහිතිට ඕනෙ වුනේ එයාගෙ මේ වීර ක්‍රියාව ගැන සේරම විස්තර කියන්නඟ ඉස්කෝලෙ වැඩ ටික ඉවර කරලා. ලේන් පැටවුන්ට කතන්දර කියල දීලා එයාල නිදි නිසා බෝනික්කොත් එක්ක සෙල්ලම් කරන්න කියල ඇඳට ගියපු සිහිතිට එහෙම්ම නින්ද ගියා.

" චූටි දූ.. චූටි දූ... "

අම්මගෙ කටහඬ ඇහිලා සිහිති ඇස් දෙකත් පොඩි කර කර නැගිට්ටා.

" එන්න ලේන් පැටවුන්ට කිරි දෙන්න"

අම්ම එහෙම කියනකොටම ඉක්මනට ඇඳෙන් බැහැලා සිහිති සාලෙට දිව්වා. එතකොට තමා එයා තාත්තා ඇවිත් ඉන්නවා දැක්කෙ.දූවගෙන ගිහින් තාත්තගෙ ඔඩොක්කුවට පැනලා අම්ම කිරි එක හදා ගෙන එනකන් වෙච්ච හැම දෙයක්ම වචනයක් නැර කිව්වා. සිහිතිගෙ පන්ඩිත වැඩ දැකලා අම්මටයි තාත්තටයි දෙන්නටම හොඳටම හිනා.

අම්ම කූඩෙ ඇරලා එක පැටියෙක් හෙමිහිට පරිස්සමට අරගත්තා.

චූටි සිරින්ජරයක් ඇරන් ඒකෙන් කිරි අරගෙන හෙමින් හෙමින් අම්ම ලේන් පැටියට කිරි පොවන හැටි සිඟිති  බලන් හිටියෙ කටත් ඇරගෙන.



ඔහොම ඔහොම අම්මා පැටවු දෙන්නාටම කිරි පෙවුවා. ආයෙත් ඒ දෙන්නව පරිස්සමෙන් කූඩෙන් තියලා අම්මා කුස්සියට ගියා. අම්මා ගත්තා වගේ පරිස්සමෙන් හෙමීට සිහිතිත් එක ලේන් පැටියෙක්ව අතට ගත්තා.

"හරිම චූටි"

එයාට නිකන්ම කියවුනා. සිගිති චුටි ලේන් පැටියව පරිස්සමෙන් අත ගෑවා.

“ අපි මේ දෙන්නට නම් දාන්න ඕනෙ නේද අම්මෙ”

ඉතින් එදා ලේන් පැටවු දෙන්නට ලියෝ සහ රියෝ කියලා නම් දෙකකුත් ලැබුනා.

" චූටි දූ එන්න තේ බොන්න"

තාත්තා කතා කරපු නිසා අකමැත්තෙන් වුනත් සිහිතිට ලේන් පැටියව ආයෙත් තියන්න වුනා. රෑ වුනා. සිහිති නිදා ගන්න වෙලාවත් ලන් වුනා. එයාට අයෙත් සැරයක් ලේන් පැටවුන්ට කිරි පොවනව බලන්න ඕනෙ වුනා.ඒත් සිහිතිගෙ අම්ම කියුවා එයාල තාම පොඩි නිසා දවසට එක පාරක් කිරි දුන්නම ඇති කියලයි. ඉතින් සිහිතිගෙ ඒ බලාපොරොත්තුවත් නැතිවෙලා ගියා.

ඊට පස්සෙ සිහිති ලේන් පැටවුන්ට කතන්දරයකුත් කියලා දීලා නිදා ගත්තා.

ඊලඟ දවස නිවාඩු දවසක් නිසා සිහිනි ටිකක් පරක්කුවෙලා ඇහැරියෙ. ඒ වෙනකොටත් සිහිනිගෙ තාත්තා වැඩට ගිහිල්ලයි හිටියෙ. ඉතින් එයා නැගිටලා මූන කට හෝදගෙන ලස්සන මල් මල් ගවුම් පොඩ්ඩිත්තක් ඇද ගත්තා. අම්ම සිහිනිට ලස්සන කොන්ඩයක් දාලා කොන්ඩෙන් මලකුත් ගැහුවා. සිහිනි ඊට පස්සෙ දුවලා ගියේ ලේන් පැටවු බලන්න.ඒත් ඒ වෙනකොටත් එයාල නිදි. ඉතින් උදේට කාල සිහිනි මිදූලට ගියා සෙල්ලම් කරන්න. සිහිනි මිදූලට ගිහින් පුලුන් බබාත් එක්ක සෙල්ලම් කරා අම්මගෙ මල් පැළ වලට වතුර දැම්මා ඒවිතරක්ද කුරුලු පැටවු එක්ක සින්දුත් කියුවා. අම්ම ලේන් පැටවුන්ට කිරි දෙන්න සිහිනිට කතා කරන්කන්ම සිහිනි හිටියෙ මිදූලෙ සෙල්ලම් කරකර. අම්මා කතා කරනවත් එක්කම සිහිනි සුටුස් ගාලා ගේ ඇතුලට ගියා.

කලින් දවසෙ වගේම අම්මා ලේන් පැටව් දෙන්නට පරිස්සමින් හිමීට ඉවසීමෙන් කිරි පෙව්වා. සිහිනිටත් ඒක උත්සාහ කරලා බලන්න ඕනෙ වුනා.එත් අම්මා එවෙලෙ කියුවෙ " එයාලත් තාම පොඩියිල ඔයත් තාම පොඩියි" කියලයි.

සිහිනිට ඕනෙ වුනේ මේ පැටවු ඉක්මනට ලොකු වෙනවා බලන්න. ටික දවසක් ගත වුනා එන්න එන්නම ලේන් පැටවු කිරි බීලා කිරි බීලා ලොකු වුනා. සිහිනි ගොඩක්ම සතුටු වුනේ ලේන් පැටවු දෙන්න හරියට ඇස් ඇරපු දවසේ. ඒත් තාමත් චූටි පැටවුන්ට කිරි පොවන්නනම් සිහිනිට ලැබුනෙ නම් නෑ.

ඉතින් දවස් ගෙවුනා හැමදාම සිඟිති ලේන් පැටවුන්ට කතන්දර කියුවා. සින්දු කියුවා. සෙල්ලම් කරා. ලේන් පැටවුන්ට තිබුන එකම ප්‍රශ්නෙ වුනේ පුලුන් බෝලෙ. පුලුන් බෝලෙ එහා ගෙදර ටොමියත් එක්ක හැම තිස්සෙම ලේන් පැටවු දෙන්නට කුරුමානන් අල්ලන එකමයි වැඩේ. පැටවු දෙන්න ලොකු වෙන්න ලොකු වෙන්න පුලුන් බෝලෙගෙන් එයාල පරිස්සම් කරන එක තවත් අමාරු වුනා.ඔහොම කල් ගෙවුනා දැන්නම් පැටවු දෙන්න හරිම දඟයි. එක අතකට ගත්තම අනිත් අතින් දුවනවා. ඒ වගේම පැටවු දෙන්න සිඟිතිටත් එයාගේ අම්මටත් ගොඩක් ආදරේ කරා.



ඉතින් කාලෙ ඔහොම ගෙවුනා ලේන් පැටවු දෙන්න සිහිතිගෙ හොදම යාලුවො වුනා. එයා හැම දාම ඉස්කොලෙ වෙන දේවල් ලේන් පැටවුන්ට කියුවා.ලේන් පැටවුනුයි සිහිතියි අතර යාලුකම එන්න එන්නම වැඩි වුනා. සිහිතිගෙ අම්මයි තාත්තයිත් මේ ගැන හරිම සතුටිනුයි හිටියෙ. කාලේ ගතවුනා. ලේන් පැටවු තවත් මේ පවුලට සමීප වුනා. ඒ වගේම සිහිතිට පුලුවන් වුනා පැටවුන්ට කිරි පොවන්න.

ඒත් එක දවසක් සිහිතිගෙ අම්මට සිහිතිව ගෙදර තනියම තියලා යන්න වුනා. වැඩි ඈතකට නෙවෙයි ඒ ලඟම තිබුන සිහිතිගෙ අත්තම්මගෙ ගෙදර. මොකද සිහිතිගෙ අත්තම්මට අසනීප වුනා. සිහිතිගෙ තාත්තත් එතකොට වැඩට ගිහින් හිටියෙ. ඒ වගේම එදා හොඳටම වැස්ස දවසක්.ඉතින් සිහිතිගෙ අම්මා සිහිතිවයි පුලුන් බබාවයි දෙන්නවම ඇතුළට දාලා උපදෙස් ගොඩකුත් දීලා දොරවල් ඔක්කොම වහලා කුඩේකුත් අරන් ගෙදරින් එලියට ආවා.තනියම එයාව දාල යන්න හිත දුන්නෙ නැති වුනත් වැස්ස ගොඩක් තද නිසා අම්මට කරන්න වෙන දෙයක් තිබුනෙ නෑ.

අම්ම ගියාට පස්සෙ සිහිතිටත් කරන්න දෙයක් තිබුනෙ නෑ. ඉතින් එයා ලේන් පැටවු ගාවට ගියා. ඒත් ඒ දෙන්නම වැස්සත් එක්ක සැපට නිදි. පුලුන් බබත් ගොරව ගොරව නිදි. සිහිති සෝෆා එකේ ඉදගෙන ජනේලයෙන් ඔහේ වැස්ස දිහා බලන් හිටියා. දන්නෙම නැතුව සිහිතිට පුටුව උඩම නින්ද ගියා.

" දඩබඩාස්.... බව් වව්... බව් වව්...."

ටික වෙලාවකින් බඩු පෙරලෙන සද්දයක් එක්ක පුලුන් බබාගෙ සද්දෙ ඇහෙනව වගේ ඇහිලා ලස්සන හීනයක් බල බල හිටපු සිහිති උඩ ගිහින් ඇහැරියා.

" අනේ.. අම්මී.."

සිහිති කෑගහගෙන පුටුවෙන් බිමට පැන්නා. එතකොටත් ලියෝයි රියෝයි පස්සෙන් පුලුන් බබා පන්නනවා. සිහිතිට හිතා ගන්න බැරි වුනා කොහොමද මේක වුනේ කියලා. මොකද ලේන් පැටවු ඉන්න කූඩෙ තියලා තිබුනෙ පුලුන් බබාට ලන් වෙන්න බැරි තැනක. ඒ වගේම පැටවු නිදි නිසා සිහිති කූඩෙ වහලයි ගියෙ.ඉතින් කොහොමද මෙහෙම වුනේ? ප්‍රශ්න ගොඩක් හිත හිතම සිහිතිත් මෙයාලව නවත්තන්න ඒ පස්සෙන් දිවුවා. ගෙදරම එක විනාශයක් බඩු පෙරළිලා කුඩු වෙලා ඒත් සිහිති කොච්චර උත්සාහ කරත් මේක නවත්තන්න බැරි වුනා.රියෝ පුටුවක් උඩින් පනිනකොටම පුලුන් බබා පැනල එයාව අල්ලගත්තා. එපා කියාගෙන සිහිතිත් එතනට දුවගෙන ගියා.

ඒත් ඒ වෙනකොටත් පුලුන් බබාගෙ දත් අතරට රියෝ අහුවෙලා ඉවරයි. ලියෝත් ඈතකට වෙලා බලාගෙන ඉන්නවා සිහිති දැක්කා. සිහිති අඬ අඬා පුලුන් බබාව එලෙවුවා. සිහිතිගෙ සද්දෙට බය වෙලා පුලුන් බබා දුවලා ගිහින් කාමරේ ඇඳ යටට රින්ගුවා.එයා චූටි රියෝව අත් අතරට ගත්තා.

ඒ වෙනකොටත් රියෝ හිටියෙ අමාරුවෙන් හුස්ම ගන්න ගමන්. සිහිනිත් නවත්තන්නෙම නැතුව අඬනවා. ලියොත් දුක්මුසු සද්ද පිට කරේ හරියට අඬනවා වගේ. සිහිනි ගේ ඇතුලට දුවලා ගිහින් ගෙදර තිබුන බෙහෙත් පෙට්ටිය අරන් ආවා. පුලුන් කෑල්ලකුයි ප්ලාස්ටරේකුයි බෙටඩින් බෝතලයයි අරගෙන එයාට පුලුවන් විදිහට රියෝට බෙහෙත් දැම්මා. ඒ වෙනකොටත් සිහිනි පරක්කු වැඩියි. සිහිනිගෙ කකුලත් තුවාල වෙලා. ඒත් එයාට ඒ ගැන ගානක්වත් නෑ. සිහිනි රියෝව අත් අතරට ගත්තා. මෙච්චර ලොකු හරියක් වෙලා තිබුනත් සිහිනිගෙ අම්මයි තාත්තයි මේ ගැන තාම කිසිම දෙයක් දන්නෙ නෑ. සිද්දිය වෙලා පැය භාගයක් විතර ගියා. ගෙදර දොරේ අගුල කැරකෙන සද්දෙ සිහිනිට ඇහුනා. ඒත් එයාට නැගිටින්නවත් හිතුනෙ නෑ.

අම්මා ඇතුළට එනවත් එක්කම සිහිනි හයියෙන් අඬන්න පටන් ගත්තෙ අම්මගෙ ඇගේ ලේ වතුර කරමින්.

" ඇයි පුතේ ඇයි? මොකද වුනේ? අඬන එක නතර කරල කියන්නකො මැනික. මොකක්ද වුනේ ? "



අම්මා නොනවත්වාම සිහිතිව සනසන්න හැදුවත් ඒක ලේසි වුනේ නෑ. ගෙදරට වෙලා තියෙන දේ දැක්කම අම්මට තවත් බය හිතුනා. අන්තිමට සිහිති අම්මගෙ උකුලේ සන්සුන් වුනා. ඊට පස්සෙ සිහිති වෙච්ච හැම දේම අම්මට එකින් එක කියන්න පටන් ගත්තා.

අම්මටත් ඇත්තටම කතාව අහලා ගොඩක් දුක හිතුනා. බිම වැටිල හිටපු රියෝව අම්ම අත් අතරට ගත්තා. සිඟිතිගේ බෙහෙත් කිරිල්ල හරි ගිහින් නැහැ.ලේන් පැටියගෙ මුලු ඇඟම සීතලවෙලා ගිහින් ගල් වෙලා.ඒ ලගින්ම ලියොත් වේදනාවෙන් බලන් හිටියා. අම්ම දෙන්න දිහාම දුකින් බලන් හිටියා. ගේ ඇතුල එක පිස්සන් කොටුවක් වෙලා. සිඟිතිට අඬලා අඬලා අම්මගෙ උකුලෙම නින්ද ගියා.අම්ම පරිස්සමට සිඟිතිව වඩාගෙන ගිහින් ඇඳෙන් තිබ්බා. සිඟිතිගෙ තුවාලෙට බෙහෙතුත් දැම්මා. ලියෝවත් අරගෙන කූඩෙන් තිබ්බා. පුලුන් බබා කොහෙද කියල හෙව්වත් අම්මට පුලුන් බබාව හොයාගන්න බැරි වුනා. රියෝ මේ වෙනකොටත් මේ ලෝකෙන් ගිහිල්ල ඉවරයි.

අම්මා දුකින් රියෝවත් අරන් අයිනකින් තියලා ලොකු සුසුමක් හෙලලා කොස්සක් අතට ගත්තා. හෙමීට හෙමීට ගේ අස්කරන්න පටන් ගත්තත් ඒක එච්චර ලේසි වුනේ නෑ. හැම තැනම වීදුරු කැලි, මල් පෝච්චි වල කැලි විසි වෙලා තිබුනා.අම්මටත් වෙච්ච දේට හරිම දුකයි. මොකද ඉතින් අම්මත් පැටවු දෙන්නට ගොඩක් ආදරේ කළා.කොහොම කොහොම හරි අම්ම ගේ අස්කරල ඉවර කරා. එතකොට වෙලාව හවස පහට විතර ඇති. සිඟිතිගෙ තාත්ත එන වෙලාවත් දැන් ලන් වෙලා. සිඟිතිගෙ අම්ම ඇඟපත හෝදගෙන සාලෙට ඇවිත් පුටුවකින් ඉද ගත්තා.

අම්මටත් ගොඩක් මහන්සියි.මහන්සිය හින්ද පුටුව උඩම අම්මට නින්ද යාගෙන ආවා. ඒත් එක්කම ගෙදර දොර ඇරෙන සද්දෙ ඇහුන නිසා අම්මගෙ නිදිමත් නැති වෙලා ගියා. ඒ සිහිතිගෙ තාත්තා. අම්ම හෙමින් හෙමින් තාත්තට මුලු විස්තරේම කියුවා.තාත්තටත් වෙච්ච දේ ගැන දුක හිතුනා. සාලෙන් ඇහෙන සද්ද නිසා සිහිති හෙමීට ඇදෙන් නැගිට්ටා. වෙච්ච් දේවල් මතක් වෙනකොට හීනි ඉකියක් සිහිතිගෙන් එලියට පැන්නා.එයා හෙමීට සාලෙට එබුනා. සිහිතිව දැක්ක තාත්තා හිනාවෙලා සිහිතිට ලගට එන්න කියුවා. සිහිතිව ඔඩොක්කෙට අරගෙන තාත්තා සිහිතිට  ස්වාභාවික ලෝකයේ වෙන මෙහෙම  දේවල් ගැන කියලා දුන්නා. රෑට කෑම කාල ඉවර වෙලා අම්මා ලියෝට කිරි පොවන්න ගියා. ඒත් පැටියා කිරි උගුරක්වත් බිවුවෙ නෑ. පුලුන් බබාට කන්න දෙන්න හෙවුවත් එයාව හොයන්න බැරි වුනා. ඊලග දවසෙ උදේම සිහිති පෙට්ටියක් අරන් රියෝව වළදාන්න පුලුවන් විදිහට හැදුවා. තාත්තට කියලා පොඩි වළක් කපාගෙන ලෝන් පැටියව වැලලුවා. සිහිතිට කෙසේවෙතත් ලියෝට නන් රියෝ නැතුව ගොඩක් පාලු දැනෙන්න ඇති. ඉස්සර වගේ ලියෝ දැන් දඟ කරන්නෙත් නෑ. එයා හරියට කෑම කන්නෙත් නෑ. කොහෙදෝ ඉදලා පුලුන් බබාත් ආයෙ ගෙදර ඇවිල්ලා.රියෝ නැතුව දවස් ගෙවිලා ගියා. එන්න එන්නම ලියෝ දුර්වල වුනා. එක දවසක් සිහිති උදේ ඇහැරිලා  ලියෝව බලන්න ගියා. ඒත් එයා දැක්කෙ හිස් කූඩයක් විතරයි.කූඩෙ කවදාවත් වහල තියන්නෙ නැතිවුනත් පැටවු සිහිති ඇවිත් ගන්නකන් එලියට එන්නෙ නෑ.


ඉතින් එයා හැම තැනම ලියෝව හෙව්වත් එයාට කොහෙන්වත් පැටියව හොයාගන්න බැරි වුනා. සිහිති දූවගෙන ගිහින් අම්මට මේක ගැන කියුවා.අම්මයි සිහිති දෙන්නම එකතුවෙලා ලියෝව හොයන්න පටන් ගත්තා. ඒත් එයාලට ලියෝව හොයාගන්න බැරි වුනා. සිහිති අම්මව බදාගෙන අඬන්න පටන් ගත්තා. එයාලට තේරුනා මේ වැඩේ නම් පුලුන් බබාගෙ වැඩක් නෙවෙයි කියලා. සති ගානක් ගෙවිලා ගියා.ලේන් පැටවු නැතුව ඉන්න සිහිති පුරුදු වුනා. හැබැයි ඒ පාලුව මකන්න කාටවත් බැරි වුනා. සිහිති ට ඕනෙ වුනේ ලොකු වෙලා රියෝ වගෙ ලියෝ වගේ ලේන් පැටවුන්ට එතකොට අනිත් සත්තුන්ට හරියට බෙහෙත් දාන්න.එයාලට ඕනෙ වෙන වෙලාවට එයාලට උදව් කරන්න.........

කාලය නොසිතූ වේගයෙන් ගෙවිලා ගියා.

# වසර 20 කට පසු

" අම්මෙ මම යනවා . "

එහෙම කියන ගමන් සිහිති අම්මටයි තාත්තටයි වැඳලා ගෙදරින් එළියට බැස්සා. සිහිති දැන් පොඩි ළමයෙක් නෙවෙයි. එයාට දැන් අවුරුදු විසිපහක් වෙනවා.එදා ඒ චූටි හිතේ ඇතිවෙච්ච බලාපොරොත්තුව සිහිති කොහොමහරි ඉෂ්ට කරගත්තා. එයා හොදට ඉගෙන ගත්තා. දැන් සිහිති එයා ලගට එන එයාගෙන් උදවු ඕනෙ වෙන හැම සතෙක්ටම උදවු කරනවා. එයාලගෙ ලෙඩ හොද කරනවා. ඔව් එයා දැන් පශු වෛද්‍ය වරියක්. ඒ කියන්නේ සත්තුන්ට වෙදකම් කරන කෙනෙක්. එයාට ඕනෙ වුනා වගේම රියෝ වගේ ගොඩක් සත්තුන්ට ලේන් පැටවුන්ට එයා උදව් කරනවා.ඒ වගේම ලියෝ රියෝ කියන මතක හැමදාමත් සිහිතිගෙ හිතේ රැඳිල තියෙනවා.



නිමි

## පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය' ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි' පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

මෙයට
සෙනෙවිරත්න මහලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක
2023 . 11 . 01